**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 11/93**

රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1993.06.04 වෙනි දින

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රජයට අයත් ආයතනවල ප්‍රධානීන් වෙත.

**අවතැන් වී සිට ආපසු පැමිණි අය නැවත සේවයේ පිහිටුවීම**

උක්ත කරුණ සම්බන්ධව නිකුත් කරන ලද 1988 අප්‍රේල් 25 දිනැති අංක. 14/88, 1990 අගෝස්තු 07 දිනැති අංක 33/90, 1991.02.17 දනැති අංක 4/91, 1991 මාර්තු 14 දිනැති අංක 10/91, 1991 නොවැම්බර් 14 දිනැති අංක 53/91, 1991 නොවැම්බර් 19 දිනැති අංක 14/88(1), 1992 පෙබරවාරි 21 දිනැති අංක 09/92 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව නැවත සේවයේ පිහිටුවන ලද රජයේ නිලධාරියෙකු පලාත් පාලන සේවයේ සේවකයෙකු, රාජ්‍ය සංස්ථා සේවකයෙකු, උද්ගත වූ තත්ත්වය ඔවුනට පාලනය කර ගත නොහැකි වූ හේතූන් නිසා ඇති වූවක් බැවින්, නොකඩවා සේවයේ සිටියා සේ සලකා අදාල වැටුප් තල වල පිහිටු විය යුතුය.

03. එවැනි නිලධාරියෙකු / සේවකයෙකු නොපැමිණි කාලසීමාව සඳහා පහත දැක්වෙන අන්දමට නිවාඩු ලබා ගැනීමට ඉඩදිය යුතුය.

(I) පවත්නා වර්ෂයේ පාවිච්චියට නොගත් අනියම් හා විවේක නිවාඩු.

(II) පූර්වාසන්න වර්ෂයේ පාවිච්චියට නොගත් විවේක නිවාඩු.

(III) තම සේවා කාලය තුලදී පාවිච්චියට නොගත් පසුගිය ඕනෑම වසර දෙකක විවේක නිවාඩු.

(IV) ඉතිරි වන යම් කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු.

04. ඉහත 03 (IV) ඡේදයේ දක්වා ඇති වැටුප් රහිත කාල පරිච්ඡේදය විශේෂ කාරණයක් සේ සලකා විශ්‍රාම වැටුප් සඳහා සේවා කාලයක් සේ ගණන් ගත යුතුවේ.

05. ඉන්දියාවේ සිට ආපසු පැමිණෙන සහ ශ්‍රී ලංකාවේ සරණාගත කඳවුරුවල රැඳී සිටි සරණාගතයන්ටද මෙම අනුග්‍රහය හිමි වනු ඇත.

අ.කලේ/ කේ.එච්. කැමිලස් ප්‍රනාන්දු
වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන, පලාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය